# විප්‍රවාසී කිවියෝ

## කස්තිරම

ඩී බී කුරුප්පු






විප්‍රවාසී කිවිඳියන් ගැන ලිවීමෙන් පසු කිවියන් ගැනත් නොලියා සිටීම හරි නැත. යටත් පිරිසෙයින් සැකෙවින් හෝ ඔවුන් ගැන සඳහන් කළ යුතුය.

එසේ කරන්නට පෙරාතුව කිවිඳියන් ගැන ලියූ ලිපි දෙකට පසු වදනක්ද ලිවිය යුතුය. මෙරට වසන අපේ කිවිඳියන් අතරට සිඩ්නිවාසී ඇනට් ගුණසේකර ඇතුළත් නොකළෙමි. එක අතකින් එය අතපසු වීමෙකැයි කිව හැක. අනෙක් අතට ඇගේ දෙවැනි කවි පොත 'අතීත හෙවනැලි' පළ වූ බව මා දැන ගත්තේ ලිපි දෙක පළ වීමෙන් පසුවයි. දෙවැන්න, 'පිය සෙනෙහස' නමින් වූ කවි පොතට වඩා ගුණයෙන් උසස් වනු ඇතැයි සිතමි.

විප්‍රවාසී කවියන් අතරින් මා දන්නා තරමට, වෙනත් රටක වාසය කරන්නේ එක් කෙනෙකි. ඒ මා කලින් ලිපියක සඳහන් කල වෛද්‍ය ඒ. ඒ. ඩබ්ලිව්. අමරසිංහ ය. ඔහු තම දිවියේ සිද්ධි සහ අත්දැකීම් ඇසුරින් ලියූ අඩසියවසදිය' නැමැති කවි පොත පළ වූයේ 2000 දී ය. ඒ රටේම පුරවැසියකු වූ හද්‍රජී මහින්ද ජයතිලක විවිධ අංශ පිළිබඳව පොත් ගණනාවක් රචනා කළ ශ්‍රී ලංකාවේ ද ජන ප්‍රිය ලේඛකයෙකි. ගීත රචකයෙකි. ඔහු කවි ලියන බවක් නො දනිමි.

ඔස්ට්‍රේලියාවේ සිංහලයෙකුගේ කවි පොතක් පළමු වතාවට පළ වූයේ 1995 දීය. ඒ සිඩ්නිවාසී හෙන්රි කුමාරප්පෙරුම ගේ 'සමනළ දූතය' යි. ශ්‍රී ලංකාව බලා පියාසර කරන සමනළයා ජනාධිපතිනිය වෙත ගෙන යන සංදේශය දැයටත් රටටත් සුබ පැතුමකි. රට තුළ පවත්නා සටනින් ජය පැතුමක් දෙනු ලැබේ. චන්ද්‍රිකා යුගයේ ලියැවුණු එය සංදේශය නමින් හඳුන්වන්නට කවියා නොසිතුවේ ඇයි දැයි සොයා බැලූ මට පෙනී ගියේ සමනළ සංදේශයක් දෙවැනි ලෝක සංග්‍රාමය පැවැති අවදියේ ලියැවී ඇති බව ය. ගිලීමලේ ධර්ම ශ්‍රී රත්නකුමාර විසින් රචනා කරන ලද එය විජය ශ්‍රී සමනළ සංදේශයයි. එයත් සටනක් ගැන කියන්නකි. සමනළයා සක් දෙවිඳුන් වෙත ගොස් අයැදින්නේ සවැනි ජෝර්ජ් රජ්ජුරුවන්ට ජය හා සෙත සලසන ලෙසට ය. 'බැබලේවා අපේ ඉංග්‍රීසි ජය කොඩිය' යනුවෙන් අගට කියන එම සංදේශයෙන් එකල කවීන්ගේ රාජපාක්ෂික භාවයන්ද පිළිබිඹු කරතැයි සිතමි.

කුමාරප්පෙරුමගේ 'සමනළ දූතයා' තවත් අතකින් වැදගත්ය. ඔස්ට්‍රේලියාවේ දී ලියැවුණු පළමු සිංහල පොත ද එයය.

ඊ ළඟට මෙරට බිහිවුණු කවි පොත ජගත් ජේ. එදිරිසිංහ ගේ 'සිසිරයේ පිපුණු මල' යි. ඒ 2000 දී ය. එයට ඇතුළත් වනුයේ එතෙර මෙතෙර දෙක්හිම අත්දැකීම් ඇසුරෙන් නිමැවුණු කවි ය. කවියා අත් විඳින මේ සිසිරය මෙහි එන සියල්ලටම පොදු වූවෙකැයි සිතමි.

කොළ හැලුණ තුරු අතර
හිම පියලි ඉඟි කරන
කැටි ගැසුණ මීදුමට
හිරු පැරද ඉකි ගසන
මා තරව වැළඳ ගත්
මගේ සිසිරය මේය

2001 දී පළ කෙරුණු කවි පොත් දෙකක් ඇත. එකක් සෝමරත්න දිසානායකගේ සුදු කාසි හිඟන්නෙක් ය. ශ්‍රී ලංකාවේ දී එවනා කළ කවි බොහොමයක් ද එයට ඇතුළත්ය. දිසානායක තමාගේ අරමුණ මෙහිදී මුදල් උපයා ගෙන මව් රට බලා යාම බව කෙලින්ම පවසයි.

ජනිත බිම ඉවත හළ අමනයෙක්
නොවෙමි මම
මට සාප නොකරන්න දොස් නගා
දෝසි රට කාසි මල්ලක් අරන්
පසු දිනෙක හඹා-විත් හැකි සැණින්
එකතු වී ඔබ සමඟ
ලියන්නට රඟන්නට හැකි ලෙසින්
සෙත් පතනු මැන මට සෙනෙහසින්

දෙවැන්න එල්.බී. ඒකනායකගේ 'නව මැදිරි කවුළුවෙන්' ය. එල්.බී මිය යන්නට ආසන්නව සිටියදී ප්‍රකාශයට පත් එය ජගත් ජේ. එදිරිසිංහ ගේ කවර නිර්මාණයක්ද සහිතව මේ රටේ මුද්‍රණය කරන ලද එකම පොත යයි සිතමි. තමා සොයා යන්නේ සෞන්දර්ය යයි කියන එල්.බී.ඒකනායක මෙසේ පවසයි.

යොදුන් දහසින් එහා
ඈත දීපංකරේ
සුනිල තණ බිම් සොයා
ගොසින් නව දෙරණකට
පටන් ගෙන හා පුරා
කියා මුල ඉඳන් හැම
අළුත් දිවි පෙවෙතකට
වෙලා අවතීරණය

අප හැර දා ආ මව් බිම ගැන ඇති සාංකාව ඔහුගේ කවි තුළින් ඉස්මතු වන්නේය.

2003 දී 'බොඳ වූ ලොව' රචනා කළ ආචාර්ය පාලිත ගනේවත්ත 2005 දී 'ඇසි පිය' රචනා කරන අවදිය වන විට කවියෙකු හැටියට බෙහෙවින් ඉදිරියට ගොස් ඇති බව ඔහුගේ නිමැවුම් තුළින් පිළිබිඹු වන්නේය. 'සැප්තැම්බර් 11' නමින් වූ රචනය අගනා නිදසුනකි.

නිව්යෝර්ක් පුරවර
උසම දෙකුළුණ
බිම හෙළී
දනන් දන හද නැවතිණ

දෙකුළුණ මුවා කළ
හිරු රැස
සුන්බුන් මත වැටිණ

'ඇසි පිය' ද එබඳුම නිමැවුමකි.

නොරට සිට නෙත වසා
මව් බිම හඟිමි
නෙත හැර බැලූ කල
නොරටම හිඳිමි

සිඩ්නිවාසී ලක්ෂ්මන් කොඩිතුවක්කු ගේ 'පැය අටේ මිත්‍රයෝ' 2005 දී පළ වූ කවි පොතකි. මේ රටෙහි පුවත්පත් සඟරා වලද පළ කෙරුණු ඔහුගේ නිමැවුම් ඇතුළත් මෙම කාව්‍ය සංග්‍රහය එරට මෙරට දෙරටේදිම අත්දැකීම් ඇසුරෙන් රචිත කවි වලින් යුතු වෙයි. 'ආදිවාසියාගෙන් පණිවිඩයක්' නමින් වූ කවෙන් කොඩිතුවක්කු නෙත් යොමු කරන්නේ බොහෝ කවියන්ට, ලේඛකයන්ට නොපෙනෙන මෙරට දිවියේ වැදගත් පැත්තක් දෙසට ය.

සෙවණ දෙන රතු අහස අපේමයි
ඒ අහසේ පායන හිරු සඳු තරු අපේමයි
ඒ හිරු සඳු තරු හිමි නැති
පුරවැසියෙක්මි මමත් මේ මහාදිපේ
සහතිකයක් ලබා නොගත්
කිසිවෙකුගේවත් දෑතින්..

ඔහුගේ 'මල් ශාලා හිමිකරු' කියූ කවක්ද උපුටා දැක්විය යුත්තකි.

මිනිසුන් මරන් නැති
එහෙත් මැරෙනවට
කැමති මං
මරණයක් හැමදාම දැක දැක
ඇයි? බය
මරණයට මෙතරම්

පර්ත් නුවර වාසය කරන සුනිල් ගෝවින්නගේ රචනා කළ 'මතක දිවයින' 2006 දී පළ කෙරුණකි. මෙහි ආ බොහෝ දෙනෙකුට ඇති වන පසුතැවිල්ල ගෝවින්නගේ ද සිය කවි තුළින් ඉදිරිපත් කරන්නේය.

එකම රුහිරු වැල්මය ගත දුවන්නේ
එහෙත් උන් සුදුය කළු වුව තැවෙන්නේ
උගත් සියළු දේ නුහුරින් දකින් නේ
කුමන එමට මා මේ රට වෙසෙන්නේ..

තමා ලියූ කවි සහ කෙටිකතා පළ කරවා ගනු වස් මව්බිම වෙත රැගෙන යාමට සිතන කවියාට එහි වෙසෙන මිතුරකු දෙන අවවාදය අනෙක් කවීන්ට හා ලේඛකයන්ටද ප්‍රයෝජනවත් විය හැකිය.

ඔබේ කවි මම අසා ඇත්තෙමි
ගුණ නුගුණ එහි හොඳින් දන්නෙමි
රහල් හිමි සේ මහා කවියක්
ලියූවද ඉන් එලය කිම අද?
මෙරට ඉපදෙන කිසිම දරුවෙකු
නොකියවනු ඇත ඔබ ලියන කවි..

ඔස්ට්‍රේලියානු සිංහල කවීන් අතරට අළුතින්ම එක් වුණු කෙනෙකි ටියුඩර් අමරසේන. ඒ 2007 දී පළ කෙරුණු ඔහුගේ 'කරල් ඇහිදින්නෝ' නැති කවි එකතුව වන්නේය. ටියුඩර් ශ්‍රී ලාංකිකයින්ට පුරුදු කවියෙකි. ඔහුගේ පොත් දෙකක් කලින් පළ වී ඇත. 'කාලයයි මේ අවදි වන්නට' (1982) සහ 'අළුගෝසුවාගේ සිහිනය' (1990) යනුවෙනි. අපේ මව් බිමේ වත්මන් තත්වද පිළිබිඹු කරන නිමැවුම් ගණනාවක් ඇතුළත් එම කවි පොතේ මව් බිමෙන් පලා ගිය පුතුට යනුවෙන් එන කවි පංතියේ එක් කවක් මෙසේය.

නීතිය රැකි පුතුන් මරු මුව වැටුණු සඳ
බීතිය නැගී නුඹෙ සිත කය ඇවිළුවෙද?
රහසින් ගොසින් එතරෙක දුක් කඳුළු මැද
මව් රට නෑසියන් සිහිකොට තැවෙනවද?

මෙය කවීන් හඳුන්වා දීමක් පමණි. ඔවුන්ගේ නිමැවුම් ඇගයීමේ තැනක් නොවේ. ■

## කවි කොළය

*බඩු මිළ පහත දැමුමට සිරි ලංකාවේ*
*සක්කර පුතා වයිමටවත් බැරිලු අනේ*
*බන්දුල සර් පවසන මේ න්‍යායට*
*හොඳහැටි හිතා බැලුවොත් කළ යුතු මේකයි*

*බැඳලා ආර්ථීක බණ පොත් මිටියකට*
*දල්වා සඳුන් කපුරුත් අඩු පාඩුවට*
*වැඳලා කියමු දුක දේවාලයට ගිහින්*
*වයිමට බාර කරවමු ඔය ඇමතිකම*

*වෙත්තසිංහ*

